# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2020/6 - 2017 මැයි මස 22 වැනි සඳුදා - 2017.05.22**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත**

15 (1) වැනි වගන්තිය යටතේ නියමය

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 15 (1) වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව මොරටුව නගර සභාව වෙත පැවරී ඇති ඉඩමක් වශයෙන් මෙහි පහත සඳහන් උපලේඛනයේ සඳහන් වඩා පූර්ණ ලෙස විස්තර කර ඇති ඉඩම අද දින සිට ක්‍රියාත්මක වන පරිදි නාගරික සංවර්ධන අධිකාරිය වෙත මෙම නියෝගය මගින් සතු කරමි.

පාඨලී චම්පික රණවක (පා.ම.),<br>
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2017 මැයි මස 16 වැනි දින,<br>
17 හා 18 වන මහල්,<br>
''සුහුරු පාය''<br>
බත්තරමුල්ල,<br>
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරටුව මහ නගර සභා සීමාව තුළ මොරටුව ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක 520214 හා 2010 ජූලි සිට 2010 සැප්තැම්බර් වශයෙන් සඳහන් කැඩැස්තර සිතියමේ කැබලි අංක 165 වශයෙන් පෙන්නුම් කෙරෙන උතුරින් කැබලි අංක 123, 124 සහ 125 ට ද, නැගෙනහිරින් එකී 520214 කැඩැස්තර සැලැස්මේ කැබලි අංක 121 සහ 179 ට ද, දකුණින් එකී අංක 520214 කැඩැස්තර සැලැස්මේ කැබලි අංක 180 ට ද, බස්නාහිරින් එකී අංක 520214 දරන කැඩැස්තර සැලැස්මේ කැබලි අංක 182 හා 163 ට ද, මායිම් වූ ප්‍රමාණයෙන් (හෙක්. 0.1830) හෙක්ටයාර් බිංදුවයි දශම එකයි අටයි තුනයි බිංදුවක් වූ මාදන්ගහවත්ත නැමති ඉඩම.

06 - 178

1A - G 25564 — 08 (2017/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*